# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 76 දරන සමෝදා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 දෙසැම්බර් මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 දෙසැම්බර් මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# 2009 අංක 76 දරන සමෝදා පදනම
# (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 දෙසැම්බර් මස 23 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 7/2008.

## සමෝදා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"සමෝදා පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක් ඒ පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමේ පරමාර්ථ සහ ඒ පදනමට සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා මෙතෙක් කල් පවත්වාගෙන ගොස් ඇති හෙයින් ද : — පූර්විකාව.

එකී පදනම සංස්ථාගත කරන මෙන් ඉල්ලා ඇති හෙයින් සහ එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 76 දරන සමෝදා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "සමෝදා පදනමේ" දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන පදනමේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සමෝදා පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති පදනමක් විය යුතු අතර, එකී සංස්ථාපිත නමින් පදනම විසින් ද, පදනමට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි වන්නේ ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. — සමෝදා පදනම සංස්ථාගත කිරීම.

3. පදනම සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— — සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) අගහිඟකම් ඇති ජනතාවට අවශ්‍ය මූලික පහසුකම් සලසා දීම ;